


# ක්ෂේත්‍ර මෙහෙයුම් නීති කටයුතු අංශය

වගකීම දරණ නිළධාරීන්ගේ නම : එස්.එන්.එල්.රත්නවීර මයා - සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ(කෘෂි පර්යේෂණ)
වගකීම දරණ නිළධාරීන්ගේ දුරකථන අංක : 0714157611

| මහජනතාව වෙත සපයනු ලබන සේවාවන් | එම සේවාවන් ඉටුකරනු ලබන ආකාරය (සවිස්තරාත්මකව) |
|---|---|
| පළිබෝධනාශක හා සම්බන්ධ ගොවීන්ගේ ක්ෂේත්‍ර ගැටළු විසදීම. | ගැටළු පිළිබඳව වාර්තාවක් ප්‍රදේශයේ කෘෂිකර්ම උපදේශකවරයාගෙන් ලබා ගැනීම. ගැටළුව ඇති වී ඇත්තේ පළිබෝධනාශකයේ වරදකින් බව තහවුරු කර ගතහොත් ගොවි මහතාට වන්දියක් ලබාදීම සඳහා අදාල සමාගමට උපදෙස් දීම. |
| මහජනතාවට විශ්වාසවන්ත, කාර්යාක්ෂම හා ලාභදායී පළිබෝධ පාලන සේවාවක් ලබාදීම. | අවශ්‍ය දැනුම, පළපුරුද්ද, උපකරණ, නිවැරදි ක්‍රමවේදයන් සහිත සහ පුද්ගලයන්ට හා පරිසරයට ආරක්ෂාකාරී වන ලෙස ක්‍රියාත්මක වන පළිබෝධ පාලන සේවා ලියාපදිංචි කිරීම හා ඒවායේ කටයුතු අධීක්ෂණය කිරීම. |
| ගැටළුවට අදාළ පළිබෝධනාශක පමණක් වියාට ලැබෙන බවට තහවුරු කිරීම | පළිබෝධනාශක අලෙවිකරුවන් පුහුණු කිරීම හා පුහුණු ලාභියකු සහිත අලෙවි සැල් පමණක් ලියාපදිංචි කිරීමට කටයුතු කිරීම. |
| මහජනතාවට හානියක් නොවන අයුරින් සීමිත පළිබෝධනාශක භාවිත කෙරෙන බව තහවුරු කිරීම | සීමිත පළිබෝධනාශක භාවිතය සඳහා අවශ්‍ය පහසුකම්, දැනුම හා පළපුරුද්ද සහිත ආයතනවලට පමණක් සීමිත පළිබෝධනාශක පාලනයක් සහිතව නිකුත් කිරීම. |
| ගොවීන්ට හා පරිසරයට ගැටළුවක් වී පවතින හිස් පළිබෝධනාශක ඇසුරුම් ඉවත් කිරීම | හිස් ඇසුරුම් එකතු කිරීම සඳහා ස්ථාන ස්ථාපනය කොට ඒවාට හිස් ඇසුරුම් ගෙනැවිත් දමන ලෙසට ගොවීන් දැනුවත් කිරීම හා එකතුවන හිස් ඇසුරුම් ප්‍රතිචක්‍රීකරණය සඳහා යොමු කිරීම. |
| මහජනතාව වෙත ආරක්ෂාකාරී පරිසරයක් තහවුරු කිරිම | කල් ඉකුත් වූ හා නීත්‍යානුකූල නොවන පළිබෝධනාශක මිනිසාට හා පරිසරයට අහිතකර නොවන අන්දමින් අපහරණය කිරීමට කටයුතු කිරීම. |
| මහජනතාව වෙත නිවැරදි කෘෂිකාර්මික දැනුම හා අවබෝධය ලබාදීම | ගුවන් විදුලිය, රූපවාහිනිය, පුවත්පත් වැනි ජනමාධ්‍ය මඟින් මහජනතාව දැනුවත් කිරීමට වැඩසටහන් ඉදිරිපත් කිරීම හා ලිපි සැපයීම. |